සියළුම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாண கல்வித் திணைக்களம்,
Western Provincial Department of Education

කලාප අධ්‍යාපන කාර්යාලය - හොරණ
வலயக் கல்விக் காரியாலயம் - ஹொரணை
**Zonal Education Office - Horana**

දෙවන වාර ඇගයීම - 2024
இரண்டாம் தவணைப் பரீட்சை – 2024
**Second Term Evaluation - 2024**

| ශ්‍රේණිය / தரம் / Grade | 9 | විෂයය / பாடம் / Subject | ගණිතය | පත්‍රය / வினாத்தாள் / Paper | I, II | කාලය / காலம் / Time | පැය 02 යි |
|---|---|---|---|---|---|---|---|

විභාග අංකය : ..........................................

## I කොටස


* 1 සිට 20 තෙක් ප්‍රශ්න සියල්ලට ම මෙම ප්‍රශ්න පත්‍රයේ ම පිළිතුරු සපයන්න.
* එක් ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් හිමි වේ.

(1) $\sqrt{253}$ අගය සෙවීම ට විද්‍යාත්මක ගණක යන්ත්‍රයක යතුරු ක්‍රියාත්මක කළ ආකාරය පහත දැක්වේ. හිස්තැන් පුරවන්න.

ON → [ ] → 2 → 5 → 3 → [ ]

(2) $4x^2 - 9$ හි සාධක සොයන්න

(3) $x$ හි අගය සොයන්න




(4) හිස් තැන් වලට ගැලපෙන අගයන් ලියා දක්වන්න

(i) 5 : 2 = 15 : ......  (ii) 3 : ..... = 18 : 30

(5) $11011_{දෙක}$ ද්විමය සංඛ්‍යාව, දහයේ පාදයට හරවන්න.

(6) පාසලක සිසුන් සංඛ්‍යාව 850 කි . මෙම සංඛ්‍යාව ආසන්න 100 ට වටයන්න


(7) $n$ වන පදය $5n + 1$ සංඛ්‍යා රටාවේ 41 වන්නේ කි වැනි පදය ද ?

(8) $\frac{1}{2}+\frac{3}{4}\times\frac{1}{6}$ සුළු කර පිළිතුර සරල ම ආකාරයෙන් දක්වන්න

(9) $5(x-2)+3=18$ විසඳන්න.

(10) 5, 8, 11, 14 …. සංඛ්‍යා රටාවේ සාධාරණ පදය $(Tn)$ ලියන්න.

(11) $x$ හි අගය සොයන්න




(12) $x^2 + 4x - 12$ හි සාධක සොයන්න

(13) $\frac{5a^3 \times 2a^4}{a^2}$ සුළු කරන්න.


(14) $(x+4)(x-2)$ ප්‍රසාරණය කර සුළු කරන්න.

(15) 0.542 සංඛ්‍යාව විද්‍යාත්මක අංකනයෙන් ලියන්න.

(16) පතුලේ වර්ගඵලය 250 $cm^2$ වූ ඝනකාභ හැඩති භාජනයක 12 cm උසට ජලය පිරී තිබේ . ජලයේ පරිමාව $cm^3$ වලින් සොයන්න .

(17) $I = \frac{ptr}{100}$ සූත්‍රයේ $r$ උක්ත කරන්න

(18) රූපයේ දී ඇති තොරතුරු අනුව පයිතගරස් සම්බන්ධය භාවිතයෙන් AB දිග සොයන්න.




(19) කම්බියක දෙකෙළවර එකට පෑස්සීමෙන් අරය 14 cm වූ වෘත්තාකාර රාමුවක් තනා ඇත. කම්බියේ දිග සොයන්න.

(20) රු 5000 ක ඔරලෝසුවක් රු 4500 ට විකුණනු ලබයි නම් ලැබෙන වට්ටම් ප්‍රතිශතය සොයන්න.

## II කොටස

* පළමු ප්‍රශ්නය ට හා තවත් ප්‍රශ්න **4** කට පිළිතුරු සපයන්න

* පළමු ප්‍රශ්නය ට **ලකුණු 16** ක්ද අනෙක් ප්‍රශ්න සඳහා එක් එක් ප්‍රශ්නයට **ලකුණු 11** බැගින්ද හිමි වේ.

01. (a) පථ හා නිර්මාණ පාඩමේදී ඔබ විසින් අධ්‍යයනය කල මූලික පථ ගණන කියද ?

කවකටුව හා සරල දාරය භාවිතාකර නිර්මාණ රේඛා පැහැදිලිව දක්වමින්

(b) i. PQ = 9 cm සරල රේඛා ඛණ්ඩයක් අඳින්න

ii. PQ රේඛාවේ ලම්බ සමච්ඡේදකය නිර්මාණය කර එය PQ ඡේදනය කරන ලක්ෂ්‍යය O ලෙස නම් කරන්න.

iii. O ලක්ෂ්‍යය කේන්ද්‍රය වන සේ OP අරය ඇති වෘත්තය නිර්මාණය කරන්න

iv. R , වෘත්තය මත පිහිටන සේ $P\hat{Q}R = 60^0$ නිර්මාණය කරන්න.

v. PQR ත්‍රිකෝණය සම්පූර්ණ කර $P\hat{R}Q$ හි අගය මැන ලියන්න

vi. $P\hat{R}Q$ කෝණ සමච්ඡේදකය නිර්මාණය කර එය වෘත්තය හමුවන ලක්ෂ්‍යය S ලෙස නම් කරන්න

vii. $R\hat{S}P$ හි අගය මැන ලියන්න

02. $y = 3x + 2$ ශ්‍රිතය මගින් දැක්වෙන ප්‍රස්තාරය ඇඳීම සඳහා සකස්කළ අගය වගුවක් පහත දැක්වේ

| $x$ | -2 | -1 | 0 | 1 | 2 |
|---|---|---|---|---|---|
| $y$ | -4 | ....... | 2 | ....... | ....... |

i. වගුවේ හිස්තැන් පුරවන්න

ii. ඛණ්ඩාංක තලයක් මත ඉහත ශ්‍රිතයේ ප්‍රස්තාරය අඳින්න

iii. ඉහත ප්‍රස්තාරයේ අනුක්‍රමණය හා අන්තඃ ඛණ්ඩය ලියන්න

iv. මෙම ශ්‍රිතයේ ප්‍රස්තාරයට සමාන්තරව (0,-2) ලක්ෂ්‍යය හරහා ගමන් කරන සරල රේඛාවේ සමීකරණය ලියන්න


03. (a) රූපයේ දැක්වෙන තොරතුරු අනුව

i. $B\hat{D}E$ සොයන්න

ii. $B\hat{C}D$ සොයන්න

iii. $A\hat{C}B$ සොයන්න

iv. $A\hat{B}C$ සොයන්න




(b) ABC ත්‍රිකෝණයක $\hat{A} + \hat{B} = 125^0$, $\hat{B} + \hat{C} = 100^0$ $\hat{A}$ , $\hat{B}$ , $\hat{C}$ හි විශාලත්ව වෙන වෙනම සොයන්න.


04. (a) $3x + 4y = 23$

$3x + 2y = 19$ සමගාමී සමීකරණ යුගලය විසඳන්න

(b) $\frac{3x}{2} + \frac{x}{4} = 7$ සමීකරණය විසඳන්න

(c) $\frac{y + 8}{3} = 4$ සමීකරණය විසඳන්න

05. සමාන අර්ධ වෘත්ත 2ක් හා සමචතුරස්‍රයක් සංයුක්ත කර ඇති ද්විපාර්ශවික සමමිතියක් ඇති ආස්තරයක රූපයක් දැක්වේ ( $\pi = \frac{22}{7}$ වේ)




(a) i. අර්ධ වෘත්තාකාර කොටසක අරය සොයන්න

ii. අර්ධ වෘත්තාකාර කොටසක චාප දිග සොයන්න .

iii. ආස්තරයේ පරිමිතිය සොයන්න .

(b) $\frac{(a^{-2})^2 \times a^4}{a^2 \times (a^{-3})^2}$ සුළුකරන්න.

(c) $2^{-2} \times 8 + 5^0$ හි අගය සොයන්න

(06) a. නිවසක දිනපතා භාවිතය සඳහා අවශ්‍ය ජලය රැස් කරන ඝනකාභ හැඩති ටැංකියක ඇතුලත දිග 1.5m පළල 1m හා උස 2m වේ.

(i) ටැංකියේ ධාරිතාව ලීටර කිය ද ?

(ii) දිනකට ජලය ලීටර 500 ක් පරිභෝජනය කරනු ලැබේ නම් එම ජලය දින කීයකට ප්‍රමාණවත් ද ?

( b) එක්තරා තැරැව් සමාගමක් ඉඩමක් විකුණා දීමට කොමිස් 5 % මුදලක් අය කරයි. රුපියල් 4 000 000 වටිනා ඉඩමක් විකිණීමේ දී

( i) ගෙවිය යුතු කොමිස් මුදල කොපමණ ද ?

( ii) ඉඩම් හිමියාට ලැබෙන මුදල කොපමණ ද ?

( c) රෙදි මීටර 4 ක මිල රුපියල් 600 ක් නම් රෙදි මීටර 7 ක මිල සමානුපාත භාවිතයෙන් ගණනය කරන්න

07. (a) (i) $1\frac{1}{3} \div \left(\frac{1}{3} + \frac{1}{9}\right)$ න් $\frac{3}{5}$ සුළු කරන්න

(ii) ගමනක් යාමේදී මුළු දුරෙන් $\frac{1}{3}$ ක් බසයෙන් ද $\frac{5}{9}$ ක් යතුරු පැදියෙන් ද ඉතිරිය පයින් ද ගමන් කළේ ය. පයින් ගමන් කළ දුර ප්‍රමාණය මුළු දුරෙ හි භාගයක් ලෙස දක්වන්න.

(b) පියල් ශ්‍රී ලංකා රුපියල් 60640 ක මුදලක් ඇමරිකන් ඩොලර් වලට මාරු කර ගැනීමට සිදු විය. ( ඇමරිකන් ඩොලරයක විනිමය අනුපාතිකය ශ්‍රී ලංකා රුපියල් 303.20 කි )

(i) පියල්ට ලැබුණු ඇමරිකන් ඩොලර් ගණන කීයද ?

(ii) පියල් නැවත එදිනම ඩොලර් 50 ක් ශ්‍රී ලංකා රුපියල් වලට මාරු කර ගත්තේ නම් ඔහුට ලැබෙන මුදල රුපියල් කීය ද ?

PARCEL NO

LOL.lk
BookStore

# විභාග ඉලක්ක පහසුවෙන් ජයගන්න

ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න





කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් සඟරා | O/L ප්‍රශ්න පත්‍ර |
A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත් |
School Book ගුරු අතපොත්

PADANAMA PUBLICATION | pesuru Prakashana Private Ltd. | Akura Pilot | සමනල දැනුම | T | සුභාර

පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා

## සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට

**www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න**